④ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2473/32 - 2026 පෙබරවාරි මස 01 වැනි ඉරිදා - 2026.02.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### තැපැල් කාර්යාල ආඥාපනත

(190 වැනි අධිකාරිය වන) තැපැල් කාර්යාල ආඥාපනතේ අංක 7, 8 යන වගන්ති යටතේ තැපැල් විෂය භාර අමාත්‍යවරයා ලෙස, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යවරයා වන මවිසින් මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව සම්පාදනය කරන ලද ව්‍යවස්ථාව.

වෛද්‍ය **නලින්ද ජයතිස්ස** (පා.ම.)
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය.

2026 පෙබරවාරි මස 01 වැනි දින,
කොළඹ දී ය.

ව්‍යවස්ථා

1934 නොවැම්බර් මස 30 වැනි දින අංක 8093 දරන ගැසට් පත්‍රයේ අතිරේකයෙහි පළකරනු ලැබූ සහ තදන්තර යම් ව්‍යවස්ථාවකින් සංශෝධිත 1934 මෙරට තැපැල් ව්‍යවස්ථාව, 2022.08.09 දින අංක 2292/13 දරන අති විශෙෂ ගැසට් නිවේදනයෙන් සංශෝධනය කරන ලදුව තවදුරටත් 2026 පෙබරවාරි මස 01 දින සිට පහත සඳහන් පරිදි වන ව්‍යවස්ථා පමණක් මෙමගින් සංශෝධනය කරනු ලැබේ.

1- **මුද්දර මුද්‍රිත කවර** - 9 වන ව්‍යවස්ථාවේ (2) ඡේදයේ රුපියල් 60.00 යන ඉලක්කම වෙනුවට රු. 80.00 ඉලක්කම ආදේශ කිරීමෙන්ද, රුපියල් 70.00 යන ඉලක්කම වෙනුවට රු. 90.00 යන ඉලක්කම ආදේශ කිරීමෙන්ද,

2- **සාමාන්‍ය/ ව්‍යාපාරික ලිපි** - 12 වන ව්‍යවස්ථාවේ 1 වන ඡේදයේ රුපියල් 50.00 යන ඉලක්කම වෙනුවට රුපියල් 70.00 යන ඉලක්කම ආදේශ කිරීමෙන්ද එතැන් සිට

ග්‍රෑම් 20ට වැඩි ග්‍රෑම් 100 දක්වා වැඩිවන ග්‍රෑම්10 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10.00 බැගින් ද
ග්‍රෑම්100ට වැඩි ග්‍රෑම්1000 තෙක් වැඩිවන ග්‍රෑම්50ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 20.00 බැගින්ද
ග්‍රෑම්1000ට වැඩි ග්‍රෑම් 2000 තෙක් වැඩිවන ග්‍රෑම්250ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 30.00 බැගින් ද යන වගන්ති වෙනුවට

1A - PG 7497 — 00 (2026/01)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ග්‍රෑම් 30ට වැඩි ග්‍රෑම්100 දක්වා වැඩිවන සෑම ග්‍රෑම්10ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10.00 බැගින් ද
ග්‍රෑම් 100 ට වැඩි ග්‍රෑම්1000 තෙක් වැඩිවන සෑම ග්‍රෑම්100ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 20.00 බැගින් ද
ග්‍රෑම් 1000ට වැඩි උපරිම ග්‍රෑම් 2000 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 250 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 30.00 බැගින් ද යන වගන්ති ඇතුළත් කිරීමෙන් ද,

**පුණ්‍යායතන/ සමාජ සේවා ස්වේච්ඡා සංවිධාන වලින් තැපැල් කරන ලිපි** - 12 වන ව්‍යවස්ථාවේ 3 වන ඡේදයේ රු. 30.00 යන ඉලක්කම වෙනුවට, ග්‍රෑම් 30 දක්වා රු. 50.00 යන ඉලක්කම් ආදේශ කිරීමෙන් ද;

3- **තැපැල්පත්** - 19 වන ව්‍යවස්ථාවේ රුපියල් 20.00 යන ඉලක්කම වෙනුවට රු. 40.00 යන ඉලක්කම ආදේශ කිරීමෙන් ද,

4- **මුද්‍රිත ද්‍රව්‍ය විවෘත සාමාන්‍ය ලිපි** - 21 වන ව්‍යවස්ථාවේ,
පළමු ග්‍රෑම්30 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 30.00 ක් ද,
30 ක් හෝ ග්‍රෑම් 30ට වැඩි ග්‍රෑම් 900 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 30 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 5.00 බැගින්ද
ග්‍රෑම් 900ට වැඩි ග්‍රෑම් 960 තෙක් වැඩිවන ග්‍රෑම් 30 හෝ ඉන් කොටසක් සඳහා රු. 25.00 බැගින්ද
ග්‍රෑම් 960ට වැඩි ග්‍රෑම් 1000 තෙක් වැඩිවන ග්‍රෑම්40 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 25.00 බැගින්ද
ග්‍රෑම් 1000ට වැඩි ග්‍රෑම් 2000 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 500ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 50.00 බැගින්ද යන වගන්ති වෙනුවට
පළමු ග්‍රෑම් 30 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 45.00 ක් ද,
30 ක් හෝ ග්‍රෑම් 30ට වැඩි ග්‍රෑම් 960 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 30 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 5.00 බැගින්ද
ග්‍රෑම් 960ට වැඩි ග්‍රෑම් 1000 තෙක් වැඩිවන ග්‍රෑම් 40 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 15.00 බැගින්ද
ග්‍රෑම් 1000ට වැඩි උපරිම ග්‍රෑම් 2000 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 500ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 25.00 බැගින්ද යන වගන්ති ආදේශ කිරීමෙන්ද,

5- **තැපැල මගින් සම්ප්‍රේෂණය කිරීම සඳහා ලියාපදිංචි කරන ලද පුවත්පත් ප්‍රකාශන හා වාරසඟරා** - 25 වන ව්‍යවස්ථාවේ (1) ඡේදයේ

පළමු ග්‍රෑම් 60 හෝ ඉන් කොටසක් සඳහා රු. 20.00 ද,
ග්‍රෑම් 60 සිට ග්‍රෑම් 120 දක්වා වැඩිවන සෑම ග්‍රෑම් 60 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10.00 බැගින්ද
ග්‍රෑම් 120 සිට ග්‍රෑම් 960 දක්වා වැඩිවන ග්‍රෑම් 120 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10.00 බැගින්ද
ග්‍රෑම් 960 සිට ග්‍රෑම් 1000 දක්වා වැඩිවන ග්‍රෑම් 40 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10.00 බැගින්ද යන වගන්ති වෙනුවට

පළමු ග්‍රෑම් 60 හෝ ඉන් කොටසක් සඳහා රු. 40.00 ද,
ග්‍රෑම් 60 සිට ග්‍රෑම් 120 දක්වා වැඩිවන සෑම ග්‍රෑම් 60 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10.00 බැගින්ද
ග්‍රෑම් 120 සිට ග්‍රෑම් 960 දක්වා වැඩිවන ග්‍රෑම් 120 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10.00 බැගින්ද
ග්‍රෑම් 960 සිට උපරිම ග්‍රෑම් 1000 දක්වා වැඩිවන ග්‍රෑම් 40 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10.00 බැගින්ද යන වගන්ති ආදේශ කිරීමෙන්ද,

6- **ගාස්තු නොගෙවූ හෝ අඩුවෙන් ගාස්තු ගෙවූ තැපැල් භාණ්ඩයක් සඳහා අවම අධිභාරය** - 43 වන ව්‍යවස්ථාවේ (2) වන ඡේදයේ රු. 25.00 යන ඉලක්කම වෙනුවට රු. 35.00 යන ඉලක්කම ආදේශ කිරීමෙන් ද,

7- **ව්‍යාපාරික තැපැල** - 93 වන ව්‍යවස්ථාවේ 1 ඡේදය යටතේ
පළමු ග්‍රෑම් 20 හෝ ඉන් කොටසක් සඳහා රු. 50.00 ද,
ග්‍රෑම් 20ට වැඩි ග්‍රෑම් 100 දක්වා වැඩිවන සෑම ග්‍රෑම් 10 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10.00 බැගින්ද
ග්‍රෑම් 100 ට වැඩි ග්‍රෑම් 1000 තෙක් වැඩිවන ග්‍රෑම් 50 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 20.00 බැගින්ද
ග්‍රෑම් 1000ට වැඩි උපරිම ග්‍රෑම් 2000 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 250 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 30.00 බැගින්ද යන වගන්ති වෙනුවට,

පළමු ග්‍රෑම් 30 හෝ ඉන් කොටසක් සඳහා රු. 70.00 ද,
ග්‍රෑම් 30ට වැඩි ග්‍රෑම් 100 දක්වා වැඩිවන සෑම ග්‍රෑම් 10 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10.00 බැගින්ද
ග්‍රෑම් 100 ට වැඩි ග්‍රෑම් 1000 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 100 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 20.00 බැගින්ද
ග්‍රෑම් 1000ට වැඩි උපරිම ග්‍රෑම් 2000 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 250 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 30.00 බැගින්ද යන වගන්ති ඇතුලත් කිරීමෙන්ද

**කොළඹ නාගරික බෙදීම් කලාප 15 ඇතුළත බෙදීමට මධ්‍ය තැපැල් හුවමාරුවෙන් භාරගන්නා ලිපි** - 93 වන ව්‍යවස්ථාවේ 2 ඡේදය යටතේ උපරිම බර ග්‍රෑම් 20ක් වන ලිපියක් සඳහා රු. 30.00 යන වගන්තිය වෙනුවට උපරිම බර ග්‍රෑම් 30ක් දක්වා රු. 50.00 යන වගන්තිය ආදේශ කිරීමෙන් ද,

8- **මුද්‍රිත ද්‍රව්‍ය විවෘත ව්‍යාපාරික ලිපි** - 94 වන ව්‍යවස්ථාවේ

පළමු ග්‍රෑම් 30 හෝ ඉන් කොටසක් සඳහා රු. 30.00 ද,
ග්‍රෑම් 30ට වැඩි ග්‍රෑම් 900 තෙක් වැඩිවන ග්‍රෑම් 30 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 5.00 බැගින්ද
ග්‍රෑම් 900 ට වැඩි ග්‍රෑම් 960 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 30 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 25.00 බැගින්ද
ග්‍රෑම් 960 ට වැඩි ග්‍රෑම් 1000 තෙක් වැඩිවන ග්‍රෑම් 40 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 25.00 බැගින්ද,
ග්‍රෑම් 1000 වැඩි ග්‍රෑම් 2000 තෙක් වැඩිවන ග්‍රෑම් 500 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 50.00 බැගින්ද, යන වගන්ති වෙනුවට

පළමු ග්‍රෑම් 30 හෝ ඉන් කොටසක් සඳහා රු. 45.00 ද,
ග්‍රෑම් 30ට වැඩි ග්‍රෑම් 960 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 30 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 5.00 බැගින්ද
ග්‍රෑම් 960 ට වැඩි ග්‍රෑම් 1000 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 40 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 15.00 බැගින්ද
ග්‍රෑම් 1000 ට වැඩි උපරිම ග්‍රෑම් 2000 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 500 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 25.00 බැගින්ද යන වගන්ති ආදේශ කිරීමෙන්ද,

9- **ප්‍රචාරණ තැපැල් සේවාව** - 95 ව්‍යවස්ථාවේ (11) වන ඡේදය a කොටස වෙනුවට i හා ii ලෙස ඡේද දෙකක් ඇතුළත් කිරීමෙන්;

(a) i. **බෙදීම් කලාපය තුළ;**

බර ග්‍රෑම් 20 ක් දක්වා පළමු පත්‍රිකා 1000ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 8,000.00ක් ද;
වැඩිවන පත්‍රිකා 1000ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 6,000.00 බැගින්ද;
බර ග්‍රෑම් 20 ට වඩා වැඩි සහ ග්‍රෑම් 40 ක් හෝ ඊට අඩු පළමු පත්‍රිකා 1000ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10,000.00ක් ද, වැඩිවන පත්‍රිකා 1000ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 7,000.00 බැගින්ද;
බර ග්‍රෑම් 40 ට වඩා වැඩි සහ ග්‍රෑම් 60 ක් හෝ ඊට අඩු පළමු පත්‍රිකා 1000ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 12,000.00ක් ද, වැඩිවන පත්‍රිකා 1000ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 8,000.00 බැගින්ද;
බර ග්‍රෑම් 60 ට වඩා වැඩි සහ ග්‍රෑම් 80 ක් හෝ ඊට අඩු පළමු පත්‍රිකා 1000ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 14,000.00ක් ද, වැඩිවන පත්‍රිකා 1000ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 9,000.00 බැගින්ද;
බර ග්‍රෑම් 80 ට වඩා වැඩි සහ ග්‍රෑම් 100 ක් හෝ ඊට අඩු පළමු පත්‍රිකා 1000ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 16,000.00ක් ද, වැඩිවන පත්‍රිකා 1000ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10,000.00 බැගින්ද;
බර ග්‍රෑම් 100 ට වඩා වැඩි සහ උපරිම ග්‍රෑම් 120 ක් හෝ ඊට අඩු පළමු පත්‍රිකා 1000ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 18,000.00ක් ද, වැඩිවන පත්‍රිකා 1000ක් උපරිම ඉන් කොටසක් සඳහා රු. 11,000.00 බැගින්ද;

ii. **බෙදීම් කලාපයෙන් පිටත**

බර ග්‍රෑම් 20 දක්වා පළමු පත්‍රිකා 1000ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10,000.00ක් ද;
වැඩිවන පත්‍රිකා 1000ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 6,000.00 බැගින්ද;
බර ග්‍රෑම් 20 ට වඩා වැඩි සහ ග්‍රෑම් 40 ක් හෝ ඊට අඩු පළමු පත්‍රිකා 1000ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 12,000.00ක් ද, වැඩිවන පත්‍රිකා 1000ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 7,000.00 බැගින්ද;
බර ග්‍රෑම් 40 ට වඩා වැඩි සහ ග්‍රෑම් 60 ක් හෝ ඊට අඩු පළමු පත්‍රිකා 1000 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 14,000.00ක් ද, වැඩිවන පත්‍රිකා 1000 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 8,000.00 බැගින්ද;
බර ග්‍රෑම් 60 ට වඩා වැඩි සහ ග්‍රෑම් 80 ක් හෝ ඊට අඩු පළමු පත්‍රිකා 1000ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 16,000.00ක් ද, වැඩිවන පත්‍රිකා 1000ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 9,000.00 බැගින්ද;
බර ග්‍රෑම් 80 ට වඩා වැඩි සහ ග්‍රෑම් 100 හෝ ඊට අඩු පළමු පත්‍රිකා 1000ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 18,000.00ක් ද, වැඩිවන පත්‍රිකා 1000ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10,000.00 බැගින්ද;
බර ග්‍රෑම් 100 ට වඩා වැඩි සහ උපරිම ග්‍රෑම් 120 ක් හෝ ඊට අඩු පළමු පත්‍රිකා 1000ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 20,000.00ක් ද, වැඩිවන පත්‍රිකා 1000ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 11,000.00 බැගින්ද;

10- **තැපැල් මලු සේවාව** - 95 වන ව්‍යවස්ථාවේ (IX) ඡේදයේ තැපැල් මල්ලක වටිනාකම (ලොකු) මි.මී 970x510 සඳහා රු.

7,500.00 ක් ද (කුඩා) මී. මී 760x430 සඳහා රු. 5,000.00ක් ද අතිරේක යතුරක් සඳහා රු. 500.00 ක් ද යන වගන්ති වෙනුවට

තැපැල් මල්ලක වටිනාකම (ලොකු) මී. මී 970x510 සඳහා රු. 9,000.00 ක් ද (කුඩා) මී.මී 760x430 සඳහා රු. 7,500.00 ක් අතිරේක යතුරක් සඳහා රු. 750.00 ක් ද යන වගන්ති ආදේශ කිරීමෙන්ද,

11- **රාජ්‍ය ආයතන සඳහා ලබාදෙන විශේෂ ලියාපදිංචි තැපෑල පහසුකම** - 95 වන ව්‍යවස්ථාවේ (Xi) ඡේදයේ

උපරිම බර කිලෝග්‍රෑම් 05ක්ද ඒ සඳහා අය කරන තැපැල් ගාස්තුව වශයෙන් ලියාපදිංචි ලිපි තැපැල් ගාස්තුව වන රු.60.00ට අමතරව

පළමු ග්‍රෑම් 20 සඳහා රු. 50.00 ක් ද,
ග්‍රෑම් 20ට වැඩි ග්‍රෑම්100 තෙක් වැඩිවන සෑම ග්‍රෑම්10ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10.00 බැගින් ද,
ග්‍රෑම් 100ට වැඩි ග්‍රෑම්1000 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 50ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 20.00 බැගින් ද,
ග්‍රෑම් 1000ට වැඩි ග්‍රෑම් 2000 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 250ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 30.00 බැගින් ද,
ග්‍රෑම් 2000ට වැඩි ග්‍රෑම් 5000 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 1000 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 50.00 බැගින් ද, අය කෙරේ යන වගන්ති වෙනුවට

උපරිම බර කිලෝග්‍රෑම් 05ක් ද ඒ සඳහා අය කරන තැපැල් ගාස්තුව වශයෙන් ලියාපදිංචි ලිපි තැපැල් ගාස්තුව වන රු. 60.00ට අමතරව

පළමු ග්‍රෑම් 30 සඳහා රු. 70.00 ක් ද,
ග්‍රෑම් 30ට වැඩි ග්‍රෑම් 100 තෙක් වැඩිවන සෑම ග්‍රෑම්10ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10.00 බැගින් ද,
ග්‍රෑම් 100ට වැඩි ග්‍රෑම්1000 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 100 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 20.00 බැගින් ද,
ග්‍රෑම් 1000ට වැඩි ග්‍රෑම් 2000 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 250ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 30.00 බැගින් ද,
ග්‍රෑම් 2000ට වැඩි ග්‍රෑම් 5000 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 1000 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 50.00 බැගින් ද, අය කෙරේ යන වගන්ති ඇතුළත් කිරීමෙන්ද;

12- ටෙලිමේල් - 96 වන ව්‍යවස්ථාවේ ස්ථාවර ගාස්තුව රු. 20.00 යන ඉලක්කම වෙනුවට රු. 50.00 යන ඉලක්කම ආදේශ කිරීමෙන්ද,

EOG 01 - 0272